Sinhalese

family and child connect

ඔබට සහය වන සේවා සමඟ සම්බන්ධ වන්න

අපට උදවු කළ හැකි ආකාරය

පවුලක තම දරුවන් අභියෝගවලට මුහුණ දෙන විට පවා සෞඛ්‍ය සම්පන්න සහ යහපත් ලෙස වැඩීමට සහ දියුණු වීමට දරුවන්ට තිරසාර භාවයක් අවශ්‍ය වේ. දරුවෙකුගේ මුල් අවදියේදී මෙය විශේෂයෙන් වැදගත් වේ.

ඔබට සහය අවශ්‍ය වේලාවේ පිහිටට පවුල් හා ළමා සම්බන්ධතා සේවය ඔබ වෙනුවෙන් සූදානම්ව සිටියි. ඔබට උදවු කිරීමට අපට ඔබේ ස්ථානයට අදාළ සේවා සමඟ සම්බන්ධ කළ හැකිය:

- ඔබේ දරුවාගේ හැසිරීම කළමනා කිරීම
- වඩා හොඳ පවුල් සබඳතා ගොඩනඟා ගැනීම
- නිවසේ හිංසනය නැවැත්වීම
- වියදම් සහ මුදල් කළමනා කිරීම
- මත්පැන්, මද්‍රව්‍ය සහ සූදුවේ යනාදිය පාලනය කිරීම
- නිවාස, සෞඛ්‍ය සේවා හෝ වෙනත් ප්‍රජා හෝ රජයේ සේවා වෙත යෑම

පවුල් හා ළමා සම්බන්ධතා සේවා සපයනු ලබන්නේ පවුල් සමඟ වැඩ කිරීමේ අත්දැකීම් ඇති විශ්වාසදායක, ප්‍රාදේශීය සංවිධාන විසිනි.

ඔබට අවශ්‍ය විටෙක මෙම සේවාව භාවිත කළ හැකිය. මෙය සඳහා සීමාවක් හා පිරිවැයක් නොමැත.

ඔබ අප හා සම්බන්ධ වූ විට සිදු වන්නේ කුමක්ද?

ඔබ අප හා සම්බන්ධ වූ විට ඔබ පළපුරුදු පවුල් සහයක සේවකයෙකු සමඟ කථා කර එ අය ඔබේ ගැටලුවලට ඇහුම්කන් දී ඔබගේ පවුලේ තත්ත්වය තක්සේරු කරයි. සෑම පවුලක්ම වෙනස් බැවින් ඔබ අප සමඟ කථා කරන විට, ඔබට ඔබේ තත්ත්වයට විශේෂිත වූ උපදෙස් සහ සහය ලැබෙයි.

උපදෙස් ලබා දීමෙන් හෝ සහයක සේවයක් වෙත ඔබව යොමු කිරීමෙන් එක් දුරකථන ඇමතුමකින් ඔබට උදවු කිරීමට අපට හැකි වෙයි. ඔබට නිවසේදී - හෝ ආරක්ෂිත ස්ථානයක - කථා කිරීම සඳහා ඉඩ සැලසීමට අපට හැකිය. එය අවශ්‍ය වූ විට, අපට ගෘහස්ථ හා පවුල් හිංසනය සඳහා වූ සේවා සමඟ ඉක්මනින් සම්බන්ධ කළ හැකිය.

ඔබට අන් අයට උදවු කළ හැකි ආකාරය

ඔබේ වැඩිහිටි දරුවන්, මුනුබුරු මිනිබිරියන්, පාසලේ පවුලක් හෝ රැකියා ස්ථානයේ මිතුරෙකු වැනි වෙනත් කෙනෙකු ගැන ඔබ කනස්සල්ලට පත්ව සිටින්නේද? ඔවුන්ට අවශ්‍ය සහය ලබා ගැනීමටද ඔබට උදවු කළ හැකිය.

ඔවුන් සමඟ සංවාදයක් ආරම්භ කර උපදෙස් සහ සහය සඳහා 13 32 64 අංකයෙන් පවුල් හා ළමා සම්බන්ධතා සේවය සම්බන්ධ කර ගැනීමට ඔවුන්ව දිරිමත් කරන්න. එය ඔවුන්ට අවශ්‍ය උපකාර ලබා ගැනීමේ පළමු පියවර විය හැකිය.

අප සම්බන්ධ කර ගන්න

දෙමව්පියන්ට අවශ්‍ය සහයෝගය ලැබෙන විට දරුවන් ධෛර්යමත් වේ. පවුල් හා ළමා සම්බන්ධතා සේවය තුළ, ඔබට ජීවිතයේ අභියෝග ජය ගත හැකි නිවැරදි මඟ පෙන්වීමකින් අපෙන් ලැබෙන අතර ඔබේ දරුවන්ට සෞඛ්‍ය සම්පන්න සහ යහපත් වැඩීමකට සහය විය හැකි බව අපි දනිමු.

අපගේ සේවය රහසිගතයි. ගාස්තු රහිතයි. වටියි.

දුරකථනය: 13 32 64
වෙබ් අඩවිය: familychildconnect.org.au

ඔබගේ ප්‍රදේශයට අදාළ පවුල් හා ළමා සම්බන්ධතා සේවය:

.....

.....

.....

Interpreter

ඔබට භාෂා පරිවර්තකයෙකු අවශ්‍යද?

ඔබට පරිවර්තකයෙකු අවශ්‍ය නම්, අපට එය ගාස්තු රහිතව සංවිධානය කළ හැකිය. **13 32 64** අමතා ඔබට අවශ්‍ය භාෂාව අපට කියන්න.

Funded by
Queensland Government

0869_@ඊරතු2021